අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 Fax +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/59/07/04/04 (2022) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2022.03. 18

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

පීඨාධිපතිවරුන්

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධ අභියාචනා - 2022**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරයන්ගේ 2022 වර්ෂය සඳහා සිදු කරන ලද වාර්ෂික ස්ථාන මාරුවීම් හා බැඳේ.

02. එම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලයේ තීරණ මේ සමඟ අමුණා ඇත.

03. ඒ අනුව, අභියාචනා මණ්ඩලයේ තීරණය පරිදි වෙනසක් නොවූ ස්ථාන මාරුවීම් 2022.06.01 දින සිට ක්‍රියාත්මක වේ. එබැවින්, අනුප්‍රාප්තිකයන් සේවයට වාර්තා කරන තෙක් නොසිට, ස්ථාන මාරුවීම්වලට යටත් සියලුම නිලධාරයන් අදාළ දිනයේ නව සේවා ස්ථානවල රාජකාරී භාර ගැනීමට හැකි වන සේ වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධරයෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරී සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවක දී, එම නිලධරයා වෙත ස්ථාන මාරුව ලබා ඇති ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

**සටහන - වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් දින 14ක් ඇතුළත මේ සමඟ දක්වා ඇති ආකෘති අංක 03 සම්පූර්ණ කර යොමු කළ යුතුය.**

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/59/07/04/04 (2022) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 18.03.2022

Provincial Directors of Education
Zonal Directors of Education
Presidents of National Colleges of Education

**Appeals on Annual Transfers of the Officers in Sri Lanka Teacher Educators' Service – 2022**

This refers to the annual transfers of the officers in the Sri Lanka Teacher Educators' Service executed for the year 2022.

02. The decisions of the Appeal Board in respect of the said annual transfers have been attached herewith.

03. Accordingly, the transfers remained unchanged as per the decision of appeal board come into effect from 01.06.2022. Therefore, you are kindly informed to release all the officers subjected to annual transfers from their present workstations without retaining them until the arrival of their successors so that they can assume the duties of their new workstations on the due date.

04. When an officer who has received a due transfer on an annual transfer order does not report for duty at his new workstation, the actions should be taken by the Head of Institution of the said officer's new workstation to issue him/her a Vacation of Post (VOP) notice according to the Section 217 of the Procedural Rule of the Public Service Commission.

**W.M.N.J.Pushpakumara**
Additional Secretary (Education Service Establishment)
For Secretary of Education

**Note** - If an appeal in respect of annual transfers is submitted to the Public Service Commission, the said appeal should be made within 14 days by completing the Form 03 provided herewith.